කුච්චවේලි ප්‍රාදේශීය සභාව
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 03 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කුච්චවේලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

සභාව මුදල් සහ උපචිත පදනමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. එසේවුවද, වර්ගීකරණය පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) රු.52,000 ක් වූ ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු ආදායමට බැරකර නොතිබුණි. එනිසා තැන්පතු ගිණුම ඒ සමාන මුදලකින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පුරනැගුම වැඩසටහන යටතේ 2012 සිට 2014 වසර දක්වා ක්‍රියාවට නැංවූ කර්මාන්ත වටිනාකම රු.153,291,825 ක් විය. ඒ ඒ ශීර්ෂය පෙන්නුම් කරනු වෙනුවට, පුරනැගුම ශීර්ෂය යටතේ දැක්වුණු ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍රාගාර සහ යන්ත්‍ර මෙයට ඇතුළත් විය.

1.3.3 ගෙවියයුතු ගිණුම්
-------------------

1996 සිට 2012 කාලපරිච්ඡේදය සඳහා වූ රු.442,426 ක් වූ නොගෙවූ වැටුප් හා වේතන ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැති කම

------------------------------------------

නොගෙවූ වැටුප් හා වේතන පිළිබඳ විස්තරාත්මක ලැයිස්තු රු. 3,210,635 ක් වූ බැංකු පොලී ප්‍රාග්ධන වියදම් විස්තර ලැයිස්තු සහ වරිපනම් සහ බදු ලේඛනය නඩත්තුකර නොතිබුණි. එනිසා විගණනයේදී මෙම ශේෂ තහවුරු කළ නොහැකි විය.

1.3.5 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූළ නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති-පරිච්ඡේදය 1 වගන්තිය 5(XII) | වර්ෂය සඳහා තත්‍ය ආදායම් හා වියදම් අයවැයගත ආදායම් හා වියදම් සමඟ සසඳා විචලතා පිළිබඳ පැහැදිළි කිරීමේ ප්‍රකාශයක් විගණකාධිපතිට ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | (I) අංක 396 | මාස 06 කට පෙර නිකුත් කළ එකතුව රු.345,146 ක්වූ චෙක්පත් 30 ක් පිළිබඳව කටයුතු කර නොතිබුණි. |
| | (II) අංක 571 | වසර 02 ඉක්මවූ රු.13,934,716 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,718,425 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.19,987,430 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.14,269,005 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

2.2 **ආදායම් පරිපාලනය**

-----------------------

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

--------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| ------------ | ------------ | ----------- | ------------- | ------------ | ------------- | ----------- | ----------- | ----------- |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 9,202 | 6,367 | 6,731 | 6,284 | 6,270 | 6,184 | 5,768 | 6,648 |
| කුලී | 7,380 | 4,729 | 4,427 | 3,621 | 4,166 | 3,809 | 3,899 | 3,318 |
| බලපත්‍ර ගාස්තු | 1,290 | 1,721 | 1,721 | 4 | 1,260 | 1,372 | 1,372 | 4 |
| වෙනත් ආදායම් | 11,414 | 1,777 | 1,755 | 493 | 11,021 | 4,549 | 14,545 | 471 |

2.2.2 වරිපනම් හා බදු

----------------

1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය මඟින් නියම කර ඇති පරිදි 2005 වර්ෂයේ පටන් සභා ප්‍රදේශය තුළ වූ ඉඩම්, නිවාස සහ ගොඩනැගිලි වලින් එකතුව රු.281,718 ක්වූ වරිපනම් හා බදු අයකර නොතිබුණි.

2.2.3 මුද්දර ගාස්තු

---------------

2015 ජුනි සිට මේ දක්වා කාල පරිච්ඡේදය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 ගවමස්කඩ බදුදීම

----------------------

ගවමස්කඩ කරුවන් විසින් ගෙවීම් පැහැර හැරි අවස්ථාවලදී හිඟ මස්කඩ බදු ඔවුන්ගේ තැන්පතුවලින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමනිසා මූල්‍ය ප්‍රකාශනවල රු.3,044,077 ක සමුච්චිත හිඟ මුදලක් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරිණි. මෙම හිඟ මුදල්වල කාල විශ්ලේෂණයක් විගණනය සඳහා සභාව ඉදිරිපත් කර නොතිබුණි. එනිසා විගණනයේදී ශේෂ තහවුරු කළ නොහැකි විය.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

----------------

(අ) ඉටු නොකළ කොන්ත්‍රාත්තු

--------------------------------

(i) නිලාවෙල් හි බහලුමක් ජීව වායු ගොඩනැගිල්ලක් ඉදිකිරීම

------------------------------------------------------------------

සභා අරමුදලෙන් බහලුමක් හා ජීව වායු ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.7,054,086 ක කොන්ත්‍රාතුවක් පිරිනමා තිබුණි. කර්මාන්තය ඇරඹීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණි. ඒ වෙනුවට ටෙන්ඩර් කැඳවා ඉඩමක් තෝරාගෙන තිබුණි. ඉඩම වටා පදිංචි මහජනතාව මෙමඟින්

ඔවුන්ගේ සෞඛ්‍යට බලපාලන බව දක්වමින් විරෝධතා දක්වා තිබුණි. ඒ හේතුකොට ගෙන 2018 ජූලි 18 දින වනතුරුත් වැඩ ආරම්භ කළ නොහැකිව තිබුණි.

(ii) පුල්මුඩේ ජීව වායු ගොඩනැගිල්ලක් ඉදිකිරීම

----------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී රු.2,000,000 පිරිවැයකින් ජීව වායු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සභාව තීරණය කර තිබූ නමුත්, මේ දක්වාම වැඩ ආරම්භකර නොතිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------------

මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු වැඩසටහන යටතේ රු.17,943,879 ක පිරිවැයකට ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි. 2016 මාර්තු 26 දින ගොඩනැගිල්ල සභාවට භාරදී තිබූ නමුත්, වැඩ ආරම්භ කිරීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් වැය කළ මුදල නිශ්චලවී තිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

--------------------------------

2015 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ රටවල ප්‍රධානීන්ගේ සමුළුවේදී තීරණය කළ 2030 තිරසර සංවර්ධව වැඩසටහන පිළිබඳව සභාව දැනුවත්ව නොතිබුණි.

3.2 කළමනාකරණ දුර්වලතා

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ සිදුකරන ලදී.

(අ) වසර 2006 සිට 2011 දක්වා කාලය තුළ මුදල් නොවූ චෙක්පත් 05 ක එකතුව වූ රු.15,605 ක මුදලක් අදාළ පුද්ගලයන්ගෙන් ලබාගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) ජල සැපයුම් යෝජනා ක්‍රමය සඳහා 2013 වසරේදී ප්‍රජා මධ්‍යස්ථානවලට දෙන ලද රු.700,000 ක්වූ අත්තිකාරම් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව විසින් භාවිතා කළ පික්අප් රථය 2015 දී අනතුරකින් මුළුමනින්ම හානියට පත්ව තිබුණි. මුදල් රෙගුලාසි 104 ප්‍රකාර පාඩුව නිශ්චය කර අනතුරට වගකිව යුතු පුද්ගලයන් හඳුනාගැනීම සඳහා විමර්ශන මණ්ඩලයක් පත්කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පළාත් මූල්‍ය රීති 163.3 ප්‍රකාර දින 10 ක් ඇතුළත නිරවුල් කළ යුතුව තිබූ රු.3,529,137 ක්වූ අත්තිකාරම් මේ දක්වාම නිරවුල් කර නොතිබුණි.

(ඉ) පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ කටටුකුලම් හි පුද්ගලික ඉඩමක රු.316,460 ක පිරිවැයකින් පොදු ළිඳක් ඉදිකර තිබුණි. ඉඩමේ අයිතිය ලබාගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි.

(ඊ) 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව සංචාරක නිකේතනවල වාර්ෂික ආදායමෙන් සියයට 1 ක් සභාව විසින් අය කළ යුතුවේ. එනමුත් සභාව තම බලප්‍රදේශය තුළ ක්‍රියාත්මක සංචාරක වලින් සියයට 1 ක බද්ද අයකිරීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ආසන්න වශයෙන් රු.1,500,000 ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

(උ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2014 නොවැම්බර්12 දිනැති අංක 25/2014 චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය නොමැතිව, සභා ලේකම් 2015 වර්ෂයේදී අනියම් සේවයන් 140 ක් පත්කර තිබුණි. එසේවුවද, එවැනි පත්කිරීම් සිදු කිරීම සඳහා අවශ්‍යතාවයක් නොතිබූ බව නිරීක්ෂණය විය. හිටපු ලේකම් විසින් මෙම සේවකයන්ට වැටුප් ගෙවීම සඳහා රු.1,493,294 ක අත්තිකාරම් ලබාගෙන තිබුණි. මෙම අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම බේරුම්කර නොතිබුණි.

(ඌ) ප්‍රධාන ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයේ දෙවන වගන්තිය ප්‍රකාරව වාර්ෂික සමීක්ෂණ මණ්ඩලයේ සභාපති සහ සාමාජිකයන්ට ගෙවිය හැකි දීමනාව පිළිවෙලින් රු.5,000 ක් සහ රු.4,000 ක් විය. ඒ අනුව 2015 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩලය සඳහා ගෙවිය යුතු මුදලේ එකතුව රු.13,000 ක් විය. එසේවුවද, සභාව රු.25,000 ක් ගෙවීම හේතුවෙන් රු.12,000 වැඩියෙන් ගෙවීමක් සිදුකර තිබුණි. වැඩිපුර ගෙවා තිබූ රු.12,000 ක මුදල අයකර ගැනීම සඳහා 2018 ජුලි 18 දින වන තුරුත් කටයුතු කර නොතිබුණි.

(එ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 චක්‍රලේඛයේ 4.1 වගන්තිය ප්‍රකාරව පළාත් පාලන ආයතනවල අනියම් හා තාවකාලික සේවකයන් සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු වේ. එසේවුවද, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල වෙනුවට සේවකයන්ගේ අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවා තිබුණි. 2010 ජනවරි සිට 2014 නොවැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවා නොතිබුණි.එනිසා රු.1,915,306 ක අධිභාරයක් ගෙවන ලෙස අරමුදල විසින් ඉල්ලා තිබුණි. මෙම මුදල් ගෙවීම සඳහා 2018 ජුලි 18 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඒ) ප්‍රාදේශීය සභාව පිරිවැය 24,444,588 ක්වූ කඩකාමර 35 කින් යුත් වෙළඳපොලක් පුල්මුඩේ ඉදිකර තිබුණි. ඉදිකිරීම සඳහා අවශ්‍ය වූ වැලි පුල්මුඩේ වැවෙන් ඉවත්කරගෙන තිබූ බැවින් මධ්‍යම පරිසර අධිකාරිය සහ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඉදිකරීම අනුමත කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. ව්‍යාපාර කටයුතු සඳහා ප්‍රදේශය සුදුසුදැයි නිශ්චය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යනයකින් තොරව මෙම කඩකාමර ඉදිකර තිබුණි. එනිසා ඉදිකළ දින පටන් කඩකාමර වසා තිබුණි.

(ඔ) 2015 ජුනි මසදී අංක LB-8657 දරන ජල බවුසරය අළුත්වැඩියා කිරීම සඳහා ගරාජයකට පවරා තිබුණි. එසේවුවත්, 2018 ජුලි 18 වන විටත් එය අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) 2017 ජුනි 06 දින වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සභාවට පරිත්‍යාග කරන ලද සී සෑමේ යන්ත්‍රය සඳහා ආදායම් බලපත්‍රය සහ රක්ෂණ ආවරණය ලබාගෙන නොතිබුණි. 2017 අගෝස්තු 17 දින මෙය පෙරියකුලම් ප්‍රාදේශයේදී අනතුරකට පත්ව තිබුණි. මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව මෙම කාරණය විමර්ශනය කර අනතුර සඳහා වගකිව යුත්තන් හඳුනා ගැනීම සඳහා 2018 ජුලි 18 දින වන තුරුත් කටයුතු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

සභා සේවකයන් ගෙන් රු.212,805 ක්වූ හිඟ ණය ලැබීමට තිබුණි. ඔවුන්ගෙන් හෝ ඔවුන්ගේ ඇප කරුවන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

3.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

---

2015 පෙබරවාරි 05 සහ 2015 මාර්තු 23,24 සහ 25 දිනවල සභාවේ සභාපති සභාව යටතේ වූ උප කාර්යාලය සහ පළාත් පාලන සහකාර කොමසාරිස් කර්යාලයට ගොස් තිබූ අතර, කාර්යාල වාහනයේ දෛනික ධාවන සටහන් අනුව ඔහුගේ ගමන් තහවුරුව තිබුණි. එසේවුවත්, එම දිනවල ඔහු කොළඹට නිලගමන් ගිය බැව් සඳහන් කරමින් ගමන් වියදම් හා යැපිම් දීමනා වශයෙන් රු.43,100 ක මුදලක් ලබාගෙන තිබුණි. 2018 ජුලි 18 දින දක්වාම මෙම මුදල අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

3.5. වත්කම් කළමනාකරණය

---

3.5.1 වත්කම් ලියා පදිංචි කිරීම

---

අවුරුදු 06 කට අධික කාලයක් තිස්සේ වෙනත් ආයතන විසින් පරිත්‍යාග කරන ලද වාහන 08 ක් සභාව භාවිතා කරන නමුත්, එම වාහනවල අයිතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5.2 අක්‍රීය වත්කම්

---

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) සී සෑමේ යන්ත්‍ර 02 ක් පික්අප් රථයක්, යතුරු පැදියක්, ටිපර් රථයක් සහ ගලි බවුසරයක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීම සඳහා පසුගිය වසර 01 සිට වසර 04 ක කාලය තුළ කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රදේශීය සභා සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ රු.1,359,987 ක පිරිවැයකින් ඉදිකරන ලද පුස්තකාල ගොඩනැගිල්ල 2018 ජුලි 18 දින දක්වා අක්‍රීයව පැවතිණි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

---

3.6.1 අපද්‍රව්‍ය කළමනාකරණ ගොඩනැගිල්ලක් ඉදිකිරීම

---

මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු වැඩසටහන යටතේ ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව රු.4,946,825 ක පිරිවැයකට 2015 ඔක්තෝබර් 19 දින සිල්මියා කොන්ත්‍රාත්කරුට පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරිණි.

(i) ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ ඇස්තමේන්තුවට විදුලිබලය සැපයීම, ජලය සැපයීම සහ ගොඩනැගිල්ල වටා වැටක් ඉදිකිරීම ඇතුලත් කර නොතිබුණි. එම නිසා වැඩ නිමකිරීමෙන් පසුව වුවත් ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී ඇත.

(ii) මෙම කර්මාන්තය නිමකර 2005 දෙසැම්බර් 19 දින භාරදිය යුතුව තිබුණි. එනමුත් 2018 ජුලි 18 වන තුරුත් වැඩ නිමකර නොතිබූ අතර රු.2,947.68 ක්වූ කාර්යයන් සියයට 60 ක ප්‍රමාණයක වැඩ නිම කිරීමෙන් පසු වැඩ අත්හැර දමා තිබුණි. දරන ලද වියදම නිශ්ඵලව වී තිබූ අතර, ඝන අප්‍රද්‍රව්‍ය රැස්කිරීමේ වැඩසටහන ඉදිරියට ගෙනයාමට සභාවට නොහැකිව තිබුණි.

(iii) සභාව විසින් සහා ප්‍රාදේශය තුළ රැස් කෙරෙන කසළ පුල්මුඩේ පිහිටි පෞද්ගලික ඉඩමකට බැහැර කර තිබුණි. අදාළ ප්‍රදේශයේ පාරිසරික ගැටළු ඇතිවීමට මෙය හේතුවිය හැක.

3.6.2 සෙන්තූර් ග්‍රාමීය මාර්ගය කොන්ක්‍රීට් කිරීම

----------------------------------------------

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම සඳහා වූ ප්‍රතිපාදන යටතේ සෙන්තූරු ග්‍රාමීය මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 6.2.2 ප්‍රකාරව අවම වශයෙන් ජාතික තරඟකාරී මිල ගණන් (NCB) ඉදිරිපත් කිරීම සඳහා දින 21 ක් ලබාදිය යුතු වේ. එසේවුවද, ලබාදී තිබූ දින ගණන 14 ක් විය.

(ආ) මිල ගණන් ලබාගැනීම සඳහා 2017 ජුනි 30 සිට 2017 ජුලි 13 දක්වා වූ කාල පරිච්ඡේදය සභාව විසින් නියම කර තිබුණි. එනමුත් පුවත්පත් දැන්වීම් 2017 ජුලි 01 සහ 04 දිනවල කළ නමුත්, එම කාලය තුළ ප්‍රසිද්ධ නිවාඩු දින 04 ක් විය. එනිසා, මිල ගණන් ඉදිරිපත් කළ හැකිව තිබුණේ දින 09 ක් තුළ පමණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 1.2.1 (ඇ) මඟින් අපේක්ෂිත අරමුණු මේ සම්බන්ධයෙන් ශාක්ෂාත් කරගෙන නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරුවන් කර්මාන්තය සඳහා වූ ඔවුන්ගේ මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර, කාර්මික ඇගයීම් කමිටුවේ ඇගයීමකින් තොරව රු.4,262,496 ක් සඳහා වූ කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කෙසේවුවද, කොන්ත්‍රාත්තුව පිළිගැනීමෙන් පසු කොන්ත්‍රාත්කරු වැඩ ආරම්භ කිරීම ප්‍රතික්ෂේප කරන ලදුව, පේළියේ සිටි ඊළඟ කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව භාරදිය නොහැකි විය. එනිසා වැඩ ආරම්භ කිරීම සඳහා අලුතෙන් ටෙන්ඩර් කැඳවීම අවශ්‍ය වී තිබුණි.

(ඈ) කර්මාන්තය සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව පිළිගැනීමෙන් පසු හේතු නොදක්වා වැඩ ආරම්භ කිරීම ප්‍රතික්ෂයප කළ හෙයින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 53.13(ඇ) රු.51,200 ක් සඳහා වූ මිල ඉදිරිපත් කිරීමේ බැඳුම්කරය මුදල් කළ යුතුව තිබූ නමුත් එපරිදි කටයුතු කර නොතිබුණි. තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.11.4 ප්‍රකාරව කොන්ත්‍රාත්කරුට එරෙහිව සභාව කටයුතු කර නොතිබුණි.

(ඉ) මෙම කර්මාන්තය සඳහා සීමිත ජාතික තරඟතකාරී මිල ගණන් (LNCB) කැඳවා තිබූ අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 6.2.2 පරිදි මිල ඉදිරිපත් කිරීම ලබාදිය යුතු දින 14 වෙනුවට දින 07 ක් ලබාදී තිබුණි. පළමු අවස්ථාවේදී මිල ගණන් ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙක් නැවතත් ඔවුන්ගේ මිල ඉදිරිපත් කර තිබූ අතර, ඔවුන්ගේ තෝරා ගැනීම ලිඛිතව නොදන්වා රු.5,000,000 ක මුදලකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

3.6.3 සංස්කෘතික මධ්‍යස්ථානයක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම

---------------------------------------------------------------------

පුර නැගුම වැඩසටහන යටතේ රු.5,656,434 ක මුදලකට සංස්කෘතික මධ්‍යස්ථානයක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී කොන්ත්‍රාත්තුව 2016 අප්‍රේල් 18 දින කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් සිදුකළ යෝජනාව වුයේ සංස්කෘතික කටයුතු සඳහා සංස්කෘතික ගොඩනැගිල්ලක් ඉදිකිරීමය පසුව එය මහජන බැංකුවට දීම සඳහා සැකිල්ල පරිවර්තනය කිරීමට තීරණය කර තිබුණි. යලි සැකිලිකිරීමේදී පිරිවැය රු.83,246 ක්වූ මීටර් 7.87'.... කඩා දමා තිබුණි.

(ආ) මීටර් 11.01 ක දොරක් සවිකළ බැව් සඳහන් කර රු.97,559 ක මුදලක් ගෙවා තිබුණි. මීටර් 7.77 ක දොරක් සවිකර තිබූ බැව් විගණන පරීක්‍ෂණයේදී හෙළිවිය. වැඩිපුර ගෙවූ මුදල රු.28,621 ක් විය.

4. වගකීම්භාරය සහ යහපාලනය
------------------------------------

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ XII පරිච්ඡේදයේ 168(1) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන මාර්තු 31 දිනට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වේ. එසේවුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මාසයක ප්‍රමාදයෙන් පසුව 2018 මැයි 03 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

4.2 අයවැය පාලනය
------------------

ඇස්තමේන්තුගත හා තත්‍ය වියදම් අතර සියයට 12 සිට 97 දක්වා වූ පරාසවල විචලනයන් පෙන් වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණි.

4.3 පිළිතුරු නොලත් විගණන විමුසම්
---------------------------------------

දින 14 ක් තුළ පිළිතුරු අපේක්‍ෂා කරමින් 2016 මාර්තු මස නිකුත් කළ විගණන විමසුම් 03 කට මේ දක්වාම පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

5. පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

| | පද්ධති හා පාලන | අවධානය අවශ්‍ය කරුණු |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) ලෙජර යාවත්කාලීනව නඩත්තු කිරීම |
| | | (ii) වියදම් අනුව වත්කම් වර්ගීකරණය |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය නඩත්තු කිරීම |
| | | (ii) ගබඩා ලෙජරය නිසි පරිදි නඩත්තු කිරීම. |
| | | (iii) අක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීම |
| (ඇ) | ආදායම් පරිපාලනය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම |
| (ඈ) | කොන්ත්‍රාත් පරිපාලනය | (i) කොන්ත්‍රාත්තු පිරිනැමීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිමත්ව අනුගමනය කිරීම |
| | | (ii) නියමිත දිනට කොන්ත්‍රාත් ඉටු කිරීම. |